# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,861 - 2014 මැයි මස 02 වැනි සිකුරාදා - 2014.05.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 664 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 667 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 669 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 671 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මැයි මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මැයි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

663- B 80834 - 2,875 (2014/04)
2B4 –

# බඩු බාහිරාදිය විකිණීම්

## ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණය

ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2014.05.25 වැනි ඉරිදා දින පෙ. ව. 9.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලේ ම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැණුම්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

උමේෂ් ශානක කලංසූරිය,
මහෙස්ත්‍රාත්,
ගාල්ල.

2014 අප්‍රේල් මස 03 වැනි දින,
ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### නඩු භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 1239/13 | වතුර මෝටරය | 01 |
| 02. | 8619 | කටර් අඬු | 01 |
| | | ඉස්කුරුප්පු නියන් | 01 |
| 03. | 45519 | රූපවාහිනී | 01 |
| 04. | 5259/13 | ඩීසල් | ලීටර් 89 |
| 05. | 56192 | ඩීසල් | ලීටර් 07 |
| 06. | ඒ.ආර්. 1744/13 | කුලුගෙඩි | 01 |
| 07. | 83803 | දම්වැල් කියත | 01 |
| 08. | ඒ.ආර්. 1743/13 | බිම් තරාදි | 01 |
| 09. | අංක රහිත | මහෙස්ත්‍රාත් තුමාගේ නිල රථයේ ඉදිරිපස ටයර් | 02 |
| 10. | 2095/13 | පාරු | 03 |
| 11. | ඒ.ආර්. 2488/13 | ලී බෝට්ටු | 03 |
| 12. | 3521/13 | ෆයිබර් බෝට්ටු | 01 |
| 13. | 11931 | 89-707 යතුරු පැදි | 01 |
| 14. | 19630 | 118-5565 යතුරු පැදි | 01 |
| 15. | ඒ.ආර්. 1389/13 | 106-8011 යතුරු පැදි | 01 |
| 16. | ඒ.ආර්. 2437/12 | රතුපාට ලොන්සින් වර්ගයේ යතුරු පැදි | 01 |
| 17. | ඒ.ආර්. 1188/12 | 142-2670 යමහා යතුරුපැදි | 01 |
| 18. | 20248 | එස්. පී. යූ. කේ. 1667 යතුරුපැදි | 01 |
| 19. | 83373 | එස්පීටීඅයි 9024 හොණ්ඩා සී. ඩී. 90 යතුරුපැදි | 01 |
| 20. | 57900 | 77-4615 අත්ට්‍රැක්ටර් | 01 |
| 21. | 96029 | එස්පීජ්ඩබ්. 5883 අත්ට්‍රැක්ටර් | 01 |
| 22. | 9684/13 | එස්පීජිආර් 8572 අත්ට්‍රැක්ටර් | 01 |
| 23. | 15015/13 | 77-6878 අත්ට්‍රැක්ටර් | 01 |
| 24. | 96465 | 73-7214 අත්ට්‍රැක්ටර් | 01 |
| 25. | අංක රහිත | පාපැදි | 01 |
| 26. | ඒ.ආර්. 1881/13 | පාපැදි | 01 |
| 27. | ඒ.ආර්. 1880/13 | පාපැදි | 01 |
| 28. | ඒ.ආර්.1878/13 | පාපැදි | 01 |
| 29. | ඒ.ආර්.1079/13 | පාපැදි | 01 |
| 30. | ඒ.ආර්.1882/13 | පාපැදි | 01 |
| 31. | ඒ.ආර්.1877/13 | පාපැදි | 01 |
| 32. | 22460 | පාපැදි | 01 |
| 33. | ඒ.ආර්. 2329/13 | පාපැදි | 01 |
| 34. | ඒ.ආර්. 1741/13 | පාපැදි | 01 |
| 35. | ඒ.ආර්. 1590/13 | පාපැදි | 01 |
| 36. | ඒ.ආර්.1391/13 | පාපැදි | 01 |
| 37. | 2571 | පාපැදි | 01 |
| 38. | ඒ.ආර්. 2650/12 | පාපැදි | 01 |
| 39. | 69974 | පාපැදි | 01 |
| 40. | ඒ.ආර්. 2330/13 | පාපැදි | 01 |
| 41. | ඒ.ආර්. 2331/13 | පාපැදි | 01 |
| 42. | ඒ.ආර්.2332/13 | පාපැදි | 01 |
| 43. | ඒ.ආර්.2333/13 | පාපැදි | 01 |
| 44. | ඒ.ආර්. 2334/13 | පාපැදි | 01 |
| 45. | 71935 | පාපැදි | 01 |

05-03

## මහෙස්ත්‍රාත් අධිකරණය - මාතර

### රාජසන්තක කරන ලද, මෙතෙක් හිමිකම් නොපාන ලද හා අංක රහිත නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතර මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද, මෙතෙක් හිමිකම් නොපාන ලද හා අංක රහිත නඩු භාණ්ඩ වර්ෂ 2014 මැයි 24 වැනි දින පෙ. ව. 10.00ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන අයෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින හෝ එදිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් සහ සාධක සමග අධිකරණය වෙත සනාථ කළ යුතු ය.

03. අධිකරණ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුගේ අවසරය ඇතිව වෙන්දේසිය දින පෙ. ව. 9.00 සිට වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් තීරණය කරන ලද අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් එවලේ ම මුදල් ගෙවා අදාළ දිනයේ දී ම ප. ව. 4.00ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

06. වෙන්දේසියෙන් මිල දී ගන්නා ලද ද්‍රව්‍යයන් සඳහා ගැනුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන් වීමට පෙර අධිකරණය වෙත දැන්විය යුතු අතර පසුව ලැබෙන පැමිණිලි කිසිවක් බාරගනු නොලැබේ.

08. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව දන්වා සිටිමි.

රුවන් සිසිර කුමාර,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මාතර.

2014 මාර්තු මස 12 වැනි දින,
මාතර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | 98297 | රවුම් කියත් තල 01 |
| 02. | 23122 | රවුම් කියත් තල 01 |
| 03. | 3765 | රවුම් කියත් තල 01 |
| 04. | 87053 | රවුම් කියත් තල 01 |
| 05. | 87052 | රවුම් කියත් තල 01 |
| 06. | ඒ. ආර්. 3654/12 | රවුම් කියත් තල 01 |
| 07. | 71900 | රවුම් කියත් තල 01 |
| 08. | 76946 | රවුම් කියත් තල 01 |
| 09. | 21607 | රවුම් කියත් තල 01 |
| 10. | 36201 | රවුම් කියත් තල 01 |
| 11. | 94088 | රවුම් කියත් තල 01 |
| 12. | 34458 | රවුම් කියත් තල 01 |
| 13. | 88431 | රවුම් කියත් තල 01 |
| 14. | 4445 | රවුම් කියත් තල 01 |
| 15. | 36661 | රවුම් කියත් තල 01 |
| 16. | 66438 | රවුම් කියත් තල 01 |
| 17. | 31682 | වයර් තොගයක් හා තඹ කම්බි තොගයක් |
| 18. | බී. ආර්. 917/10 | තඹ කම්බි |
| 19. | ඒ. ආර්. 3192/12 | කුරුඳු පොතු |
| 20. | බී. ආර්. 1554/10 | රබර් රොටී |
| 21. | බී. ආර්. 1476/07 | රබර් රොටී කවර දෙකක් |
| 22. | බී. ආර්. 2534/10 | තඹ කම්බි |
| 23. | ඒ. ආර්. 3192/12 | ගොරකා |
| 24. | 34460 | වයර් තොගයක් |
| 25. | බී. ආර්. 1456/10 | කඹයක් හා පිහි දෙකක් |
| 26. | බී. ආර්. 1784/11 | යකඩ කැබැල්ලක් |
| 27. | 38503 | චේන් සෝ එකක් |
| 28. | ඒ. ආර්. 4584/10 | නයිලෝන් කඹයක් |
| 29. | ඒ. ආර්. 3469/12 | ෆැක්ස් යන්ත්‍රයක් |
| 30. | බී. ආර්. 103/13 | පිත්තල සරනේරු 09ක්, හුලං කොකු 06, අගුල් 01, ඉස්කුරුප්පු නියන් 01 |
| 31. | ඒ. ආර්. 2075/10 | යකඩ වැල් එකක් |
| 32. | ඒ. ආර්. 208/11 | සී. ඩී. එම්. ඒ. දුරකථනයක් හා චාජරයක් |
| 33. | 45698 | මේස තරාදියක් |
| 34. | ඒ. ආර්. 686/08 | මේස පිහියක් |
| 35. | 76940 | මන්න පිහියක් |
| 36. | බී. ආර්. 2412/02 | මේස පිහියක් |
| 37. | බී. ආර්. 2615/10 | මේස පිහියක් |
| 38. | බී. ආර්. 1097/09 | මේස පිහියක් |
| 39. | 32186 | මේස පිහියක් |
| 40. | 35198 | මේස පිහියක් |
| 41. | ඒ. ආර්. 1029/13 | මේස පිහියක් |
| 42. | බී. ආර්. 3381/13 | මේස පිහි 02 |
| 43. | 57077 | මේස පිහියක් |
| 44. | 91228 | මේස පිහියක් |
| 45. | 35055 | මන්නා පිහියක් |
| 46. | 37102 | මන්නා පිහියක් |
| 47. | 77362 | මන්නා පිහියක් |
| 48. | 94578 | මන්නා පිහියක් |
| 49. | බී. ආර්. 667/10 | මන්නා පිහියක් |
| 50. | බී. ආර්. 93/05 | මන්නා පිහියක් |
| 51. | 16763 | මාලු කපන පිහියක් |
| 52. | බී. ආර්. 1946/06 | අත් පොරවක් |
| 53. | 99682 | පොරවක් |
| 54. | 4567 | පොරවක් |
| 55. | 35 | පොරවක් |
| 56. | බී. ආර්. 2337/09 | පොරවක් |
| 57. | 54510 | පොරවක් |
| 58. | බී. ආර්. 2575/13 | කැත්තක් |
| 59. | 26097 | කැත්තක් |
| 60. | 16766 | ඇලුමිනියම් හට්ටි 01 |
| 61. | 98146 | ප්ලාස්ටික් තාච්චි 01 |
| 62. | ඒ. ආර්. 810/09 | යතුරුපැදි ෂොක් ඇබ්සෝබර් 02 |
| 63. | බී. ආර්. 209/03 | පිත්තල පියනක් |
| 64. | 98146 | අලවංගු 01 |
| 65. | 27204 | අලවංගු 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 66. | ඒ.ආර්. 2619/12 | හෙල්මට් 01 |
| 67. | ඒ.ආර්. 3095/10 | හෙල්මට් 01 |
| 68. | ඒ.ආර්. 857/08 | හෙල්මට් 01 |
| 69. | ඒ.ආර්. 1253/08 | හෙල්මට් 01 |
| 70. | බී.ආර්. 2249/04 | හෙල්මට් 01 |
| 71. | ඒ.ආර්. 1412/12 | හෙල්මට් 01 |
| 72. | ඒ.ආර්. 16/06 | හෙල්මට් 01 |
| 73. | 48427 | ගෑස් ලිපක් සහ ගෑස් සිලින්ඩරයක් |
| 74. | 31028 | ගෑස් ලිපක් සහ ගෑස් සිලින්ඩරයක් |
| 75. | බී. ආර්. 2166/13 (97229) | ගැල්වනයිස් බට |
| 76. | බී. ආර්. 203/13 | ඔරලෝසුව සහිත රේඩියෝ එකක් |
| 77. | 58050 | මවුස් එකක් |
| 78. | අංක රහිත | මවුස් 03ක් |
| 79. | 56772 | ජංගම දුරකථන චාජරයක් |
| 80. | අංක රහිත | ජංගම දුරකථන චාජර් දෙකක් |
| 81. | අංක රහිත | වයර් කෝඩ් 01 |
| 82. | 82821 | විසිතුරු භාවුන් ජෝඩුවක් |
| 83. | 3032<br>5863<br>3030<br>3386<br>82820<br>82833 | කියත් පටි 06ක් |
| | අංක රහිත | කියත් පටි 02ක් |
| 84. | 83981 | ආරෝපිත විදුලි පන්දමක් |
| | අංක රහිත | ආරෝපිත විදුලි පන්දම් 10 |
| 85. | ඒ. ආර්. 3433/11 | ටිපර් රථයක පිටුපස දොර |
| 86. | ඒ. ආර්. 290/09 | වාහනයක දොරක් |
| 87. | බී. ආර්. 563/11 | උදැල්ලක් |
| 88. | 13328 | උදැල්ලක් |
| 89. | ඒ. ආර්. 2396/12 | පාපැදි 02 |
| 90. | ඒ. ආර්. 1417/13 | පාපැදි 06 |
| 91. | ඒ. ආර්. 106/13 | පාපැදි 01 |
| 92. | ඒ. ආර්. 341/13 | පාපැදි 01 |
| 93. | ඒ. ආර්. 941/13 | පාපැදි 01 |
| 94. | ඒ. ආර්. 3453/12 | පාපැදි 01 |
| 95. | ඒ. ආර්. 25/13 | පාපැදි 01 |
| 96. | ඒ. ආර්. 2616/12 | පාපැදි 01 |
| 97. | ඒ. ආර්. 1907/12 | පාපැදි 01 |
| 98. | ඒ. ආර්. 3596/13 | පාපැදි 01 |
| 99. | ඒ. ආර්. 3597/13 | පාපැදි 01 |
| 100. | ඒ. ආර්. 3598/13 | පාපැදි 01 |
| 101. | ඒ. ආර්. 1410/12 | පරිගණක උපාංගයක් |
| 102. | ඒ. ආර්. 1743/11 | BIRD වර්ගයේ ජංගම දුරකථනයක් |
| 103. | ඒ. ආර්.1413/12 | ලෙනෝයි වර්ගයේ ජංගම දුරකථනයක් |
| 104. | ඒ. ආර්. 2004//12 | රත්තරන් පාට සිටිසන් වර්ගයේ අත්ඔරලෝසුවක් |
| 105. | ඒ. ආර්. 860/12 | ෆෝම් වර්ගයේ ජංගම දුරකථනයක් |
| 106. | ඒ. ආර්. 3139 | ඊටෙල් වර්ගයේ ජංගම දුරකථනයක් |
| 107. | ඒ. ආර්. 3141/12 | නොකියා වර්ගයේ ජංගම දුරකථනයක් |
| 108. | ඒ. ආර්. 3660/12 | කැනොන් වර්ගයේ කැමරා එකක් |
| 109. | ඒ. ආර්. 3660/12 | එස්. ආර්. 2000 ටුවුන් වර්ගයේ කැමරාවක් |
| 110. | ඒ. ආර්. 3660/12 | පැනසොනික් වර්ගයේ කැමරාවක් |
| 111. | ඒ. ආර්.3660/12 | එන්. පී. වර්ගයේ ලැප්ටොප් පරිගණකයක් |
| 112. | ඒ. ආර්. 3660/12 | කලුපාට ලැප්ටොප් පරිගණකයක් සහ චාජරයක් |
| 13. | ඒ. ආර්. 3660/12 | අයිපොඩ් 02 |
| 114. | ඒ. ආර්. 3660/12 | රත්තරන් නොවිය හැකි රන් පැහැති චේන් 02 |
| 115. | 76328 | රවුම් කියත් තලයක්, තේක්ක වර්ගයේ ඉරූ දැව කැබලි 02ක් |
| 116. | 72337 | රවුම් කියත් තලයක් |
| 117. | 92548 | රවුම් කියත් තලයක්, මැහෝගනී වර්ගයේ ඉරූ දැව කැබලි 02ක් |
| 118. | 45755 | රවුම් කියත් තලයක්, ලුණුමිදෙල්ල වර්ගයේ ඉරූ දැව කැබලි 01ක් |
| 119. | 62698 | රවුම් කියත් තලයක්, පොල් ලී කැබැල්ලක් |
| 120. | 88433 | වී බෙල්ට් දෙකක් |

**වෙන්දේසි කිරීමට නියමිත නඩු අංක රහිත භාණ්ඩ**

121. නයිලෝන් කඹ තොගයක්
122. අංක රහිත මෝටර් 01
123. අංක රහිත මෝටර් 01
124. අංක රහිත මෝටර් 01
125. අංක රහිත මෝටර් 01
126. අංක රහිත මෝටර් 01
127. අංක රහිත මෝටර් 01
128. අංක රහිත කම්බි සහ වයර් තොගයක්
129. අංක රහිත වේවැල් කුඩ 03
130. අංක රහිත බාල්දියක් (ගැල්වනයිස්)
131. අංක රහිත කේතලයක් (ඇලුමිනියම්)
132. අංක රහිත ඇලුමිනියම් ඇතිලි 01
133. අංක රහිත විවිධ වර්ගයේ අංක රහිත පැති කණ්ණාඩි 21
134. අංක රහිත කොකිස් අච්චු 05
135. අංක රහිත පොරව තල 04
136. විවිධ ප්‍රමාණයෙන් යුතු අංක රහිත කැති 21
137. විවිධ ප්‍රමාණයෙන් යුතු අංක රහිත මන්න පිහි 21
138. අංක රහිත ට්‍රැක්ටර් බෙල්ට් 13
139. අංක රහිත අලවංගු 06
140. අංක රහිත ග්‍රයින්ඩර් 01
141. අංක රහිත ග්‍රයින්ඩර් 01
142. අංක රහිත කැමරා 02
143. අංක රහිත බ්ලෙන්ඩර් 01
144. අංක රහිත වාහන රේඩියෝ 01
145. අංක රහිත තරාදි 01
146. අංක රහිත මේස තරාදි 01ක් හා තට්ටු 02
147. අංක රහිත දුනු තරාදි 01
148. අංක රහිත කාන්තා සෙරෙප්පු ජෝඩු 03
149. අංක රහිත හෙල්මට් 08
150. අංක රහිත සවල් 02
151. අංක රහිත මුල්ලු 01
152. අංක රහිත උදලු තල 10
153. අංක රහිත පොරෝ තල 04
154. අංක රහිත ප්ලාස්ටික් අරක්කු ඇසුරුම් 32

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 155. | | අංක රහිත හිස් අරක්කු බෝතල් තොගයක් |
| 156. | | අංක රහිත හිස් බැරල් 18 |
| 157. | | අංක රහිත හිස්කෑන් 250ක් පමණ |
| 158. | | කොනිකා මිනොල්ටා 201 වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍රයක් |
| 159. | | ටොෂිබා e-STVDIO 232 වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍රය |
| 160. | | යොකොහාමා වර්ගයේ අංක එන්. අයි. ඩී. 1011 දරන ටයර් 04 |
| 161. | | ඔලිම්පියා 7698671 දරන සිංහල යතුරුලියන යන්ත්‍රය |
| 162. | | ඔලිම්පියා 7660269 දරන සිංහල යතුරුලියන යන්ත්‍රය |
| 163. | | අධිකරණයේ ප්‍රයෝජනයට ගෙන ඉවත් කරන ලද වානේ කබඩ් 07 |
| 164. | | අධිකරණයේ ප්‍රයෝජනයට ගෙන ඉවත් කරන ලද විධායක පුටු 02 |
| 165. | | අධිකරණයේ ප්‍රයෝජනයට ගෙන ඉවත් කරන ලද ලාච්චු 04 වානේ කබඩ් 03 |
| 166. | | අධිකරණයේ ප්‍රයෝජනයට ගෙන ඉවත් කරන ලද පෙට්ටි ෆෑන් 01 |
| 167. | | අධිකරණයේ ප්‍රයෝජනයට ගෙන ඉවත් කරන ලද ටියුබ් ලයිට් තොගයක් |
| 168. | | අධිකරණයේ ප්‍රයෝජනයට ගෙන ඉවත් කරන ලද සිවිලින් ෆෑන් කොටස් තොගයක් |
| 169. | | අධිකරණයේ ප්‍රයෝජනයට ගෙන ඉවත් කරන ලද කොමඩ් 01 |
| 170. | | අධිකරණයේ මායිම් වැටෙන් ඉවත් කරන ලද කම්බි දැල් තොගයක් |
| 171. | | අධිකරණයෙන් ඉවත් කරන ලද ලී කැබලි තොගයක් |
| 172. | | ලේඛනාගාරයේ වහලයෙන් ඉවත් කරන ලද උළු තොගයක් |
| 173. | | මොනිටර් 01 |
| 174. | | පරිගණක මුද්‍රණ යන්ත්‍ර 01 |
| 175. | | අංක 7332996 දරන යතුරුලියනය |
| 176. | | අංක 7338086 දරන යතුරුලියනය |
| 177. | | අංක 1121951 දරන යතුරු ලියනය |
| 178. | | අංක 118428 දරන යතුරු ලියනය |
| 179. | | අධිකරණයේ භාවිතයෙන් ඉවත් කරන ලද යතුරුලියන කොටස් |
| 180. | | අංක 4137 දරන ෆැක්ස් යන්ත්‍රය |
| 181. | | අංක 4134 දරන ෆැක්ස් යන්ත්‍රය |
| 182. | | ඒ. ආර්. 1908/12 ඩබ්. පී. ජේ. ආර්. 8560 දරන සුසුකි වර්ගයේ යතුරු පැදිය |
| 183. | | ඒ. ආර්. 2618/12 ඩබ්. පී. ජී. යූ. 4831 දරන හොණ්ඩා වර්ගයේ යතුරු පැදිය. |

05-04

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2014 ජූලි මස 01 වැනි දින සිට 2015 ජූනි 30 වැනි දින දක්වා කාලය සඳහා රා තැබැරුම් රේන්ද විකිණීම

2014 ජූලි මස 01 වැනි දින සිට 2015 ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයක්ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබැරුම් රේන්ද විකිණීම සඳහා වූ ටෙන්ඩර් 2014.05.22 වැනි දින පෙ. ව. 10.30 දක්වා ම විසින් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, නියමිත ඇප තැන්පත් කුවිතාන්සියක් ද, අදාල ටෙන්ඩරයේ සඳහන් මිලෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරේ "අංක 01 මුදුකටුව රා තැබැරුම" හෝ "අංක 02 කටුනේරිය රා තැබැරුම" සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබැරුමෙහි නම සහ අංකය සඳහන් කොට 2014.05.22 වැනි දින පෙ.ව. 10.30 ට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2014 මැයි මස 22 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබැරුම් නැවත විකිණීම 2014.06.06 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

එන්. ඒ. ඒ. පී. එස්. නිස්සංක,
ප්‍රාදේශීය ලේකම්,
නාත්තන්ඩිය.

2014 අප්‍රේල් මස 10 වැනි දින,
නාත්තන්ඩිය,
ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|
| 01. | නාත්තන්ඩිය | මූදුකටුව | 1,000 |
| 02. | නාත්තන්ඩිය | කටුනේරිය | 1,000 |

05-05

---

**මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2014/2015 වර්ෂය සඳහා මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

**2014.07.01 දින සිට 2015.06.30 දක්වා**

01. 2014 ජූලි 01 වැනි දින සිට 2015 ජුනි 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසිය හා සෑම සුරාබදු බලපත්‍රයක් ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණය යටත් පිරිසෙන් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුයි.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක 13 දරන පම්බල රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි රා තැබෑරුමෙහි නම සහ අංකය සඳහන් කොට 2014 මැයි මස 26 වැනි දින පෙ. ව. 10.00 ට පෙර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2014 මැයි මස 26 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු යි.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2014.06.10 වැනි දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අදාළ විය යුතු ය.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

එච්. එම්. එස්. පී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
මාදම්පේ.

2014 අප්‍රේල් මස 10 වැනි දින,
මාදම්පේ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| උතුරු පිටිගල් කෝරළය | පම්බල | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප.ව. 8.00 | 13 | 2014.05.26<br>පෙ. ව. 10.00 | 1,000 0 |

05-06

# රජයේ නොවන දැන්වීම්

## පාම් බීච් නිලාවේලි (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2014 මාර්තු මස 26 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 97815 යටතේ "පාම් බීච් නිලාවේලි (ප්‍රයිවට්) ලිමිටඩ්" යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 28, (දෙවන මහල), ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02, යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම් ඇන්ඩ් ඒ කම්පනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු).

අංක 28, (2 වැනි මහල),
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

05-16

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : නිකිනි ඕටෝ ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක : පී වී 91807
සංස්ථාගත කළ දිනය : 2013 මාර්තු 28
ලියාපදිංචි ලිපිනය : අංක 28, 1/5, ඒ, මකුළුගහවත්ත, හිරිපිටිය, පන්නිපිටිය

05-64

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

එංගලන්තයේ, ටීඑන් 6 2ආර්එක්ස්, සසෙක්ස්, ක්‍රෝබෝ නැගෙනහිර, බාර්න්ෆීල්ඩ්, 13 හි පදිංචි සහ දැනට ඔස්ට්‍රේලියාවේ, 2092 එන්එස්ඩබ්ලිව්, සීෆෝර්ත්, ක්ලොන්ටාෆ් ස්ට්‍රීට්, අංක 107 හි පදිංචි එලිසබෙත් බොස්ටොක් මහත්මිය වන මා විසින් කොළඹ 07, බුලර්ස් පාරේ, අංක 36 "ස්වීඩන් බෑන්ක්" හි ඇන්තනි ඩේවිඩ් ජෙෆ්රි ඔක්ස්ලේඩ් වෙත ප්‍රදානය කරන ලද එංගලන්තයේ, කෙන්ට් වෙල්ස්, ටර්න්බ්‍රිජ් හි පදිංචි ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ඉදිරියේ සහතික කරන ලද 2000 නොවැම්බර් මස 08 දිනැති ඇටෝර්නි බලපත්‍රය මෙහි සඳහන් දින සිට අවලංගු වී අහෝසි වන අතර, එය බලපැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

එලිසබෙත් බොස්ටොක් මහත්මිය.

2014 ක් වූ අප්‍රේල් මස 17 වැනි දින දී ය.

05-55

---

## සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීම පිළිබඳව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : රිසවේෂන් එල්කේ (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 63 ජී, 9 වැනි පටුමග,
අයි. ජෝතිපාල මාවත, මාලබේ.
සමාගමේ අංකය : පී වී 97961
සංස්ථාගත කිරීමේ දිනය : 2014 අප්‍රේල් 2.

අධ්‍යක්ෂ.

05-62

---

## සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ග්‍රීන් කැනොපි හොටෙල් ඇන්ඩ් සූයිට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 137, ගැට්ටුවාන වටරවුම් පාර,
කුරුණෑගල
සමාගමේ අංකය : පී වී 97743,
සංස්ථාගත කිරීමේ දිනය : 2014.03.24

සීඒඑස් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

05-61

---

## සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : යුවර් හොලිඩේස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 16, පන්සල පටුමග, කොළඹ 03
සමාගමේ අංකය : පී වී 97035
සංස්ථාගත කිරීමේ දිනය : 2014.02.13

සීඒඑස් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

05-60

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (3) වැනි වගන්ති ප්‍රකාර සමාගම් අංක පී වී 72770 දරන ට්‍රැවල් ආකේඩ් හොලිඩේස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සමාගම් අංක පීවී 2849 දරන ට්‍රැවල් ආකේඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් ඒකාබද්ධ වූ බවට මෙයින් දන්වමු.

ඒකාබද්ධ වූ සමාගමේ නම : ට්‍රැවල් ආකේඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
දිනය : 2014 පෙබරවාරි මස 10 වැනිදා

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-52

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත දක්වා ඇති සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම පහත පළ වේ.

සමාගමේ නම : බ්ලූ මාවන් ඒෂියා එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 97684
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත කළ දිනය : 2014 මාර්තු 19

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-53

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීමේ නිවේදනය පහත පළ වේ.

සමාගමේ නම : ස්පයිස් විලාස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 97640
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 730 ඒ, ඇතුල් කෝට්ටේ,
සංස්ථාගත කළ දිනය : 2014 මාර්තු 18

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-54

---

## සමාගමේ නම වෙනස් කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 (2) ඡේදය පරිද්දෙන් මෙම දැනුම්දීම කරනු ලැබේ.

සමාගමේ කලින් නම : කොපිලයින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 5890
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 243/1, ඩී ෆොන්සේකා පෙදෙස, කොළඹ 04
සමාගමේ අලුත් නම : අයිල් සබ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නම වෙනස් කළ දිනය : 2014.04.04

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02
2014 අප්‍රේල් මස 08 වැනි දින.

05-31

---

## සීමාසහිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදය යටතේ මෙම දැනුම්දීම කරනු ලැබේ.

සමාගමේ නම : ඩී. පී. ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 98044
දිනය : 2014 අප්‍රේල් මස 07 වැනි දින
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 90 ඒ, පාගොඩ පාර, පිටකෝට්ටේ, කෝට්ටේ.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.
2014 අප්‍රේල් මස 08 වැනි දින.

05-30

---

## සීමාසහිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 9 වැනි ඡේදය යටතේ මෙම දැනුම්දීම කරනු ලැබේ.

සමාගමේ නම : රේන්ෆොරෙස්ට් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 97883
දිනය : 2014 මාර්තු මස 28 වැනි දින
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 3 වැනි මහල, අයි බී එම් බිල්ඩිං, 48, නවම් මාවත, කොළඹ 02.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.
2014 අප්‍රේල් මස 04 වැනි දින.

05-29

**සීමාසහිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදයට අනුකූලව මෙම දැන්වීම කරනු ලැබේ.

සමාගමේ නම : ද ටූනා ඇන්ඩ් ද කූබ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 97867
දිනය : 2014 මාර්තු 31 වැනි දින
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 44, ධර්මපාල පෙදෙස, රාජගිරිය.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2014 අප්‍රේල් මස 02 වැනි දින,
අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.

05-28

**2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

සමාගමේ නම : ඩී. එම්. ජේම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ අංකය : පී. වී. 83666

ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 143/1/1, මුහන්දිරම් පාර, කොල්ලුපිටිය, කොළඹ 03

සංස්ථාගත කළ දිනය : 2012.01.12

අධ්‍යක්ෂ : එම්. ටී. එම්. උවයිස්.

05-25

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**හැටන් නැෂනල් බැංකුව - පී. එල්. සී. ග්‍රෑන්ඩ්පාස් ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීමයි

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව තුළ නාවල පිහිටි කොස්වත්ත දෙවන පටුමගේ, වරිපනම් අංක 30/7 දරන මීගහවත්ත, කැටකෙලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1994 මැයි 29 දාතම හා අංක 2935 දරන පිඹුරේ ලොට් සී වශයෙන් නිරූපිත ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (අක්. 01 රූඩ් 0 පර්. 15) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි පිහිටි ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේ සමග.

*ඉඩමට ප්‍රවේශ මාර්ගය.-* වැලිකඩ රාජගිරියේ සිට නාවල පාර ඔස්සේ කොස්වත්ත හන්දිය දක්වා ගමන් කොට වම්පස ඇති රණවිරු ප්‍රභාත් මාවතට හැරී එම මාවතේ ඉදිරියට ගොස් වම්පස පිහිටි 2 වැනි පටුමගට අවතීර්ණව මීටර් කීපයක් ගොස් ඉඩමට යාමට ඇති දකුණු පස තාර දමා ඇති පාරේ දකුණු පස ඇති වරිපනම් අංක 30/6 දරන අදාල ඉඩමට ප්‍රවේශ විය හැකි ය.

බැඳුම්කරු වශයෙන් විජයසිරි ඩිස්ට්‍රිබියුටර්ස් (පීවීටී) ලිමිටඩ් වෙත සපයන ලද ණය පහසුකම් වෙනුවෙන් හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත උකස් තබන ලද ඉහත විස්තර කළ දේපළ 2014 මැයි මස 21 වැනි බදාදා දින ප. ව. 01.00 ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013 ජූලි මස 26 වැනිදා රජයේ *ගැසට් පත්‍රය* ද 2013 අගෝස්තු මස 06 වැනිදා "ඩේලිමිරර්" "දිවයින" සහ "තිනකරන්" පුවත්පත් ද බලන්න.

*ගෙවීම් කරන පිළිවෙල.-*
සාර්ථක ගැණුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතුයි.

1. ගැණුම් මිලෙන් සියයට 10%,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එක) දේශීය විකුණුම් බද්ද,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. වෙන්දේසිය සහතික කිරීම සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජය හෝ වෙනත් බල අධිකාරියක් මගින් පනවා ඇති වෙනත් ව්‍යවස්ථාපිත අය බදු තීරු බදු හෝ අයකිරීම් අදාල වේ නම් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ. හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපි ලේඛන කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. සහකාර සාමාන්‍යාධිකාරී (නැවත අයකර ගැනීම්) වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය.

ඩලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරු.

අංක 146/3, කල්දේරා උද්‍යානය,
දුටුගැමුණු මාවත,
කොහුවල.

05-44

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංක බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 74133382.
මහේෂ් ප්‍රසන්න පින්දෙනිය මහතා සහ මාදම්පගේ දොන් දුල්ශ්‍රියානි මාදම්පගේ මහත්මිය යන අයට අයත් උකස්කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.10.04 දිනැති අංක 1831 දරන ගැසට් පත්‍රයේ හා 2013 සැප්තැම්බර් මස 23 වැනි දිනැති "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2014.05.20 වැනි දින පෙ. ව. 11.00 ට, කොළඹ 05, හැව්ලොක්පාරේ, අංක 290 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උකස් බැඳුම්කරයෙහි සඳහන් උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ 410/සී වහර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කිරිඳිවැල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දොම්පෙ ප්‍රාදේශීය සභා සීමාව තුළ ලුණු ගම පිහිටි රදාවලලන්ද නමැති ඉඩමට එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු කේ. ටී. පී. ආර්. අහුගම්මන විසින් සාදන ලද 1999 අප්‍රේල් මස 01 දිනැති අංක 91 ඒ/1999 දරන පිඹුරෙහි ලොට් 4 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4 උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : ලොට් 6 ද, බස්නාහිරට : ලොට් 3 ද, මායිම්ව අංක 91ඒ/1999 දරන පිඹුරට අනුව පර්චස් දහසයක (අ. 0 රූ. 0 පර්. 16) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 451/291 හි ලියාපදිංචි කර ඇත.

2. එකී ලුනුගම පිහිටි "රදාවලලන්ද" නමැති ඉඩමේ, එහි ඇති ගහකොළ ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේ ඇතුළත්ව අංක 91ඒ/1999 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා සීමා නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 5 උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරටඃ පිඹුරු අංක 775 හි ලොට් ඒ ද, දකුණට : ලොට් 6 ද, බස්නාහිරට : ලොට් 4 ද, මායිම්ව එකී අංක 91ඒ/1999 දරන පිඹුරට අනුව පර්චස් දහසයකින් (අ. 0 රූ. 0 පර්. 16)යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 451/262 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙය අංක 91ඒ/1999 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා ඇති පාරට වෙන් කළ කොටස මතින් හා ඒ දිගට මාර්ග අයිතිය ද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. සරත් කුමාර,
ශාඛා කළමනාකරු.

2014 පෙබරවාරි මස 25 වැනි දින,
ලංකා බැංකුව,
හංවැල්ල.

05-11

---

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී - වෙන්නප්පුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසිය

**කඩවත, වැබොඩ, දකුණු වැබොඩ පිහිටි පර්චස් 30.9 විශාලැති ආහාර නිෂ්පාදනය කරනු ලබන ස්ථානයක පිහිටි ඉඩම සහ ගොඩනැගිලි**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ වැබොඩ පිහිටි "කොස්ගහවත්ත" නමැති ඉඩමට අංක 808ඒ දරන පිඹුරේ සඳහන් කැබලි අංක 2බී දරන ඉඩම් කොටස.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති 144 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දොන් ඇන්තනී සුනිල් මාවලගේ සහ ප්‍රගීත් සමන්ත ලියනගේ විසින් පැහැර ඇති බැවින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලය මත වර්ෂ 2014ක් වූ මැයි මස 23 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

කඩවත, වැබොඩ දකුණු වැබොඩ අංක 177 ඒ දරන ස්ථානයේ තබා ඇති, ගබඩා කර ඇති ආහාර නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන අගනා යන්ත්‍රෝපකරණ.

පවර් ජනරේටරය, අනුක්‍රමික අංකය 544824 වර්ගය DCA 25 USI, නිෂ්පාදිත රට - ජපානය, ස්ටීම් ෆැන් කූලරය, බොයිලරය, පල්පර් (විශාල) ඉන්දියාව පල්පර් (කුඩා) ඉන්දියාව, නූඩ්ල්ස් වියලීමේ යන්ත්‍රය, නූඩ්ල්ස් සෑදීමේ යන්ත්‍රය, ස්ටීමරය, ලයිම් ඩීහයිඩ්රේටරය, බොටල් වොෂින් ප්ලාන්ට්, ස්ටීම් බාත් (කුඩා) ස්ටීම් බාත් (විශාල) රිටයිටර්ය.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති 146 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දොන් ඇන්තනී සුනිල් මාවලගේ සහ ප්‍රගීත් සමන්ත ලියනගේ විසින් පැහැර ඇති බැවින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලය මත වර්ෂ 2014ක් වූ මැයි මස 23 වැනි දින පෙ. ව. 11.15 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2014.03.28 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය ද, 2014.03.20 වැනි දින "ද අයිලන්ඩ්" "දිවයින" සහ "තිනකුරල්" පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිෂ්ඨ වන මාර්ගය.-* කොළඹ සිට නුවර පාර ඔස්සේ 20 කි. මී. කණුව පසුකර මීටර් 200ක්පමණ ඉදිරියට ගමන් කර දකුණට හැරී වැබොඩ පාර ඔස්සේ කි. මී. 2.4ක් පමණ ගමන් කර වමට හැරී කොන්ක්‍රීට් දමා නිම කර ඇති ප්‍රාදේශීය සභා පාරේ මීටර් 700ක් පමණ ගමන් කර දකුණට හැරී හාමුගේ හේන වත්ත පාරේ ඉදිරියට මීටර් 100ක් පමණ ගමන් කර දකුණට හැරී බොරලු පාරේ මීටර් 100ක් පමණ ගමන් කිරීමෙන් පාරේ වම්පසින් පිහිටි මෙම දේපළට ළඟාවිය හැකි ය.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක්ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද සහ වැට් බද්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක්ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500ක්ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000ක් ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02 නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක : 2448448, 011- 7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777- 672082, ෆැක්ස් අංකය : 2871184.

05-27

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ *ගැසට් පිටුවකින්* අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට් පිටුවකට* ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| මැයි | 2014.05.02 | සිකුරාදා | 2014.04.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2014.05.09 | සිකුරාදා | 2014.04.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.16 | සිකුරාදා | 2014.05.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.23 | සිකුරාදා | 2014.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.30 | සිකුරාදා | 2014.05.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2014.06.06 | සිකුරාදා | 2014.05.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.13 | සිකුරාදා | 2014.05.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.20 | සිකුරාදා | 2014.06.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.27 | සිකුරාදා | 2014.06.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2014.07.04 | සිකුරාදා | 2014.06.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.11 | සිකුරාදා | 2014.06.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.18 | සිකුරාදා | 2014.07.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.25 | සිකුරාදා | 2014.07.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.